**මතුගම ප්‍රාදේශීය සභාව**
**කළුතර දිස්ත්‍රික්කය**

-------------------------

1. මූල්‍ය ප්‍රකාශන

----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරිම.

----------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 21 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2013 මැයි 13 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 නොවැම්බර් 14 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

1.2 මතය

----------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වල වැදගත් බව හේතුවෙන් 2013 දෙසැම්බර් 31 දිනට මතුගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්වය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

------------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

-------------------------

පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ රු.411,500 කට මිලදී ගෙන තිබූ ත්‍රිරෝද රථය හා කොම්පෝස්ට් අංගනය සඳහා රු.100,000 කට මිලදී ගෙන තිබූ හලර් යන්ත්‍රය ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට සේවක ඇප පොත් අනුව ඇප ආයෝජන ශේෂය රු.61,620 ක් වුවද එදිනට ගිණුම් ගත කර තිබූ ශේෂය රු.77,346 ක් විය.

(ඇ) 2012 වර්ෂයේ මහ නැඟුම ව්‍යාපෘතිය යටතේ අවිච්ඡේද කර සමාලෝචිත වර්ෂයේ ඉටු කර තිබූ නමුත් විගණිත දිනය වූ 2014 මැයි 20 වන විටත් මුදල් ලැබී නොතිබුණද ව්‍යාපෘති 2 කට අදාල රු. රු.1,660,868 ක් කර්මාන්ත ණයහිමි හා ණයගැති යටතේ ගිණුම් ගත කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ කර්මාන්ත මුදල පොතේ ගෙවීම් වල එකතුව රු.54,913,010 ක් වුවද රු.53,955,669 ක් ලෙස මූලධන වියදම් යටතේ ගිණුම් ගත කර තිබීමත් කර්මාන්ත මුදල් ගිණුමෙන් පොදු මුදල් ගිණුම සඳහා සිදු කර තිබූ වියදම් රු.2,698,461ක් අඩු කිරීම වෙනුවට එකතු කර තිබීම නිසා සමාලෝචිත වර්ෂයේ මූලධන වියදම රු.4,439,581 කින් වැඩියෙන් දැක්විණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ සහික දීමනා ලැබීම් රු.711,167 ක් වැටුප් වියදමින් අඩු කර දැක්වීම නිසා එම වටිනාකමින් වැටුප් වියදම හා ආදායම් ආධාර ලැබීම් අඩුවෙන් දැක්විණි.

(ඊ) වරිපනම් බදු ගිණුමේ හිඟ ශේෂය නිවැරදි කිරීම සඳහා අවිනිශ්චිත ගිණුමට බැර කර තිබූ රු.47,546 ක් නිවැරදි කිරීම සඳහා ලියා තිබූ ජර්නල් සටහන එම වටිනාකමින් අවිනිශ්චිත ගිණුම හර, සමුච්චිත අරමුදල බැර ලෙස දක්වා තිබුණත් එය ගිණුම්වලට සටහන් කිරීමේදී සමුච්චිත අරමුදල හර කර වරිපනම් බදු ගිණුමට බැර කර තිබුණි.

(උ) ඉකුත් වර්ෂයේ වැටුප් ප්‍රතිපූර්ණය සඳහා ලැබී තිබූ මුදල්, වැටුප්වලින් අඩු කර ගිණුම් ගත කර තිබීම සමාලෝචිත වර්ෂයේ නිවැරදි කිරීම අවශ්‍ය නොවූ නමුත් සමාලෝචිත වර්ෂයේ රු.838,936 කින් අවිනිශ්චිත ගිණුම හර කර සමුච්චිත අරමුදල බැර කර තිබුණි.

(ඌ) ඉකුත් වර්ෂය අවසානයට සේවක ණය ගිණුමේ ශේෂය රු.9,252,807 ක් වුවද, ශේෂ පත්‍රයේ රු.9,226,272 ක් ලෙස සටහන් කිරීමේ වරද නිවැරදි කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේ රු.26,535 ක් සේවක ණය ගිණුම හර කර අවිනිශ්චිත ගිණුම බැර කළ යුතු වුවත් රු.270,433 කින් අවිනිශ්චිත ගිණුම හර කර සේවක ණය ගිණුම බැර කර තිබුණි.

(එ) ඉකුත් වර්ෂයේ හිඟ හිටි වැටුප් ප්‍රතිපූර්ණ ගණුමේ ශේෂය, ශේෂ පිරික්සුමට සටහන් කිරීමේදී රු.2,048,834 ක් අඩුවෙන් සටහන් කිරීම නිවැරදි කිරීමේදී එම වටිනාකම හිඟ හිටි වැටුප් ප්‍රතිපූර්ණ

ගිණුම හර කර අවිනිශ්චිත ගිණුම බැර කළ යුතු වුවත් සමුච්චිත අරමුදලට හර කර වැටුප් ප්‍රතිපූර්ණ පාලන ගිණුමට බැර කර තිබුණි.

(ඒ) ඉකුත් වර්ෂයන්හි සිට ලැබී තිබූ රු.3,995,289 ක් වූ පරිත්‍යාග ලැබීම් ප්‍රාග්ධනීත කිරීමේදී සමුච්චිත අරමුදලට බැර කර තිබීම, නිවැරදි කිරීම සඳහා එම වටිනාකම සමුච්චිත අරමුදල හර කර ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායක වීමේ ගිණුම බැර කිරීම වෙනුවට එම ගිණුම් දෙක සඳහා රු.3,267,845 ක් පමණක් ගලපා තිබුණ.

(ඔ) 2010 වර්ෂයේ ශේෂ පත්‍රයේ සඳහන් රු.77,344 ක්වූ සේවක ඇප ශේෂය ඉකුත් වර්ෂයේදී ගිණුම්වලට ගෙන නොතිබීමේ වරද සමාලෝචිත වර්ෂයේදී ද නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.

1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

(අ) පිළිතරු නොලත් විගණන විමසුම්

2014 නොවැම්බර් වන විට විගණන විමසුම් 02 කට පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 208,975,109 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.16,260,916 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු.8,980,607 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු.000’ | රු.000’ | රු.000’ |
| (i.) | වරිපනම් හා බදු | 6,974 | 4,893 | 8,315 |
| (ii.) | බදු කුලී | 5,483 | 5,039 | 1,032 |
| (iii.) | බලපත්‍ර ගාස්තු | 335 | 328 | 28 |

2:2:2 වරිපනම් බදු
--------------

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට පැවති රු.7,624,493 ක් වූ හිඟ වරිපනම් බදු ශේෂයෙන් 2014 මැයි 30 වන විට රු.689,146 ක් අය වී තිබූ අතර ඒ අනුව හිඟ ශේෂය රු.6,935,347 ක් විය.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට සභාවේ ප්‍රධාන කාර්යාල බල ප්‍රදේශයට අයත් වරිපනම් බදු ගෙවන්නන්ගෙන් රු.10,000 කට වඩා හිඟ ශේෂයක් පෙන්නුම් කරන බදුකරුවන් 43 දෙනෙකු වූ අතර ඔවුන්ගෙන් අයවිය යුතු ශේෂය රු.826,378 ක් විය. මෙම හිඟ ශේෂය අවු.1 1/2 සිට අවු. 20 දක්වා කාලයක සිට පැවත එන අතර එම හිඟ මුදල් අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි.

2:2:3 අක්කර බදු
------------

ප්‍රවර්තන වර්ෂයේ දී රු.35,993 ක් අක්කර බදු වශයෙන් බිල්කර තිබුණද ඉන් අයකර තිබුණේ රු.10,943 ක් පමණි. එසේම වර්ෂය ආරම්භයට රු.67,895 ක් වූ හිඟ ශේෂයෙන් රු.494 ක් පමණක් අයකර ගැනීම නිසා ප්‍රවර්තන වර්ෂය අවසානයට සමස්ථ අක්කර බදු හිඟ ශේෂය රු.92,451 ක් විය.

2:2:4 කර්මාන්ත හා ව්‍යාපාර බදු
-----------------------------

බල ප්‍රදේශයට අයත් ව්‍යාපාර ස්ථානවලින් ව්‍යාපාර හා කර්මාන්ත බදු රු.22,450 ක් 2014 මැයි 30 දිනට හිඟව පැවතුණි.

2:2:5 වෙනත් ආදායම්
-----------------

2013 දෙසැම්බර් 31 දිනට වෙළඳ ස්ථානීය කුලී හිඟය රු.910,945 ක් වූ අතර ඉන් ප්‍රධාන කාර්යාල බල ප්‍රදේශයට අයත් වෙළඳ ස්ථානවලින් මාස 01 සිට මාස 42 දක්වා කාල පරාසයකට අදාලව 2014 මැයි 30 දිනට හිඟව පැවති රු.442,331 ක් අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි.

2.2.6 උසාවි දඩ හා මුද්දර ගාස්තු
--------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2013 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| (i) | උසාවි දඩ | 8,000,000 |
| (ii) | මුද්දර ගාස්තු | 7,000,000 |

3. මෙහෙයුම් සමාලෝචනය
--------------------------------

3.1 නිශ්ක්‍රීය හා ඌණ උපයෝජිත භෞතික සම්පත්
---------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2010 වර්ෂයේදී මිලදී ගෙන තිබූ නූල් 5 දඟර කම්බි 66 ක් කිසිදු කාර්යයකට නොයොදවා අභාවිතව මල බැඳීමට ලක්වෙමින් සභා පරිශ්‍රයේ පැවතුණි.

(ආ) වාහන සේදීම සඳහා 2013 අගෝස්තු 18 දින රු.33,416 කට මිලදී ගෙන තිබූ අධි පීඩන යන්ත්‍රය ක්‍රියාත්මක කිරීමට නොහැකි වීමෙන් ප්‍රයෝජනයට ගත නොහැකිව තිබුණි.

(ඇ) වෙල්ඩින් ට්‍රාන්ස්ෆෝමර් යන්ත්‍රයක් ප්‍රයෝජනයට ගත නොහැකිව තිබුණි.

(ඇ) 2012 ජනවාරි 13 දින ඒකක පිරිවැය රු.700 කට මිලදී ගෙන තිබූ ඇඳි රහිත ප්ලාස්ටික් පුටු 55 ක් හා ආපදා කළමනාකරණ අධිකාරියෙන් 2011 අප්‍රේල් 20 දින ලැබී තිබූ ලීටර් 1000 වතුර ටැංකි 01 ක් ප්‍රයෝජනයට ගත නොහැකිව අබලි තත්වයෙන් සභා පරිශ්‍රයේ ගාල් කර තිබුණි.

(ඉ) 2010 මාර්තු 04 දින රු.87,765 කට ඇඟිලි සළකුණු යන්ත්‍රයක් මිලදී ගෙන තිබුණි. මිලදී ගෙන තිබූ දින සිටම යන්ත්‍රය භාවිතයට ගෙන නොතිබූ අතර 2012 ඔක්තෝබර් 23 දින යන්ත්‍රය අළුත්වැඩියාව සඳහා සැපයුම් ආයතනයට භාර දී තිබුණද විගණිත දිනය වූ 2014 මාර්තු 12 වන විටත් අළුත්වැඩියාව කර නැවත ගෙන්වා ගැනීමට කටයුතු කර නොතිබුණි.

3.2 අවිධිමත් ගනුදෙනු

---------------------

(අ) මන්ත්‍රීවරුන්ට නිල ඇඳුම් ලබාදීම සඳහා සහා අරමුදලින් වියදම් දැරීමට නීතිමය ප්‍රතිපාදන නොතිබියදී සභාවේ මන්ත්‍රීවරු 16 දෙනා සඳහා නිල ඇඳුම් වශයෙන් දග කලිසමක් සහ කමීසයක් බැගින් ලබාදීම වෙනුවෙන් 2013 දෙසැම්බර් මස රු.52,500 ක් සභා අරමුදලින් ගෙවා තිබුණි.

(ආ) සේවක අර්ථසාධක අරමුදලට සහ සේවා නියුක්තියන්ගේ භාර අරමුදලට නියමිත දිනට දායක මුදල් නොගෙවීම නිසා 2003 සැප්තැම්බර් සිට 2013 ජූලි දක්වා කාලය තළ රු.240,814 ක අධිභාර මුදලක් ගෙවා තිබුණි.

(ඇ) ස්ථිර කළමනාකරණ සහකාර කාර්ය මණ්ඩලය 22 ක්ද, අනියම්, දෛනික හා කොන්ත්‍රාත් පදනම මත සේවකයින් 14 ක්ද සභාවේ ප්‍රධාන කාර්යාලයේ සේවය කරන අතර ගිණුම් අංශයේ රාජකාරී වෙනුවෙන් නිශ්චිත නිළධාරීන් 07 ක්ද සේවයේ යොදවා තිබියදී අවසන් ගිණුමේ අඩුපාඩු නිවැරදි කිරීම සඳහා බාහිර පුද්ගලයෙකුට 2013 දෙසැම්බර් 31 දින රු.12,000 ක් ගෙවා තිබුණි.

3.3 ආර්ථික නොවූ ගනුදෙනු

-----------------------------

2012 වර්ෂයේ පළාත් නිශ්චිත කාර්යය ප්‍රදාන යටතේ 2013 පෙබරවාරි මාසයේදි මිලදි ගත් රු.300,675 ක් වටිනාකමැති තණකොළ කපන යන්ත්‍රයක් 2014 මාර්තු මාසය වන විටත් නිශ්කාර්යව පැරණි සභා ගොඩනැගිල්ලෙහි ගාල්කර තිබුණි.

3.4 සැලසුම් කමිටු දීමනා ගෙවීම.

------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2004 දෙසැම්බර් 15 දිනැති පළාත් පාලන කොමසාරිස්වරයාගේ අංක LG/07/2004 දරන චක්‍රලේඛයේ 15 ජේදයට අනුව දීමනා ගෙවීමට රාජකාරී වේලාවෙන් පරිබාහිරව පැය 2 කට වැඩි කාලයක් සැලසුම් කමිටුව පැවැත්විය යුතු අතර පැමිණීමේ ලේඛනයක් සහ වාර්තා පොතක් පවත්වාගෙන යා යුතු විය. නමුත් සභාව විසින් සැළසුම් කමිටු සඳහා පැමිණමේ ලේඛනයක් පවත්වා නොතිබූ අතර වේලාව සඳහන් නොකර වාර්තා පොතේම අත්සන් තැබීම පමණක් සිදු කර තිබුණි. සභාවේ දිනපතා පැමිණීමේ හා පිටවීමේ ලේඛනය පරීක්ෂාවේදී සැළසුම් කමිටු පවත්වා තිබූ වාර 48 න්ම එයට සහභාගි වූ නිලධාරීන්ගේ පිටවීම රාජකාරී වේලාවෙන් පසු විනාඩි 10 ත්, පැය 1 විනාඩි 30 ත් අතර කාලයක් තුල වී තිබීමෙන් රාජකාරී වේලාවෙන් පසු පැය 2 ක් සැළසුම් කමිටු පවත්වා නොතිබූ බව නිරීක්ෂණය වන අතර දීමනා වශයෙන් රු.193,950 ක් ගෙවා තිබුණි.

(ii) සැළසුම් කමිටු දීමනා ගෙවීම සඳහා අවම වශයෙන් ගොඩනැගිලි සැළසුම් 10 ක් හෝ ඊට වැඩි විය යුතු අතර 10 ට අඩු වන්නේ නම් ඒ සඳහා සාමාන්‍ය රාජකාරී වේලාව භාවිතා කළ යුතු අතර ඒ සඳහා දීමනා ගෙවීමට හැකියාව නොතිබුණි. නමුත් අවස්ථා 17 කදී ගොඩනැගිලි සැළසුම් 10 ට අඩු සංඛ්‍යාවක් පැවතියදී සැළසුම් කමිටු පවත්වා රු.68,500 ක් දීමනා වශයෙන් ගෙවා තිබුණි.

3.5 සේවක ණය

----------------

දෛනික කම්කරුවන් ලෙස සේවය කර සේවය හැර ගොස් සිටි සේවකයින් 20 ක ගෙන් 2007 සිට 2012 දක්වා කාලයට අදාලව අය විය යුතු රු.21,490 ක උත්සව අත්තිකාරම් ශේෂයක් අයකර ගැනීමට ක්‍රියා කර නොතිබුණි.

3.6 අත්තිකාරම්

----------------

2005 වර්ෂයේ සිට ගෙවා තිබූ එකතුව රු.4,283,746 ක් වූ අත්තිකාරම් ශේෂ 62 ක් 2013 දෙසැම්බර් 31 දින වන විටද ආපසු අයකරගෙන නොතිබුණි.

3.7 කොන්ත්‍රාත් පරිපාලනය

--------------------------

(අ) <u>හොරවල-මඩවල ප්‍රධාන මාර්ගයෙන් හැරී යන මඩවලවත්ත මාර්ගය කුට්ටි ගල් අල්ලා සංවර්ධනය කිරීම</u>

ඉහත මාර්ගය දිගින් මීටර් 94.6 ක්ද, පළලින් මීටර් 2.7 ක්ද කුට්ටි ගල් අතුරා සංවර්ධනය කිරීම වෙනුවෙන් රු.500,000 කට ඇස්තමේන්තු පිළියෙල කර තිබුණි. 2014 මාර්තු 11 දින තාක්ෂණික නිලධාරි සමඟ සිදු කළ භෞතික පරීක්ෂාවේදී පහත කරුණු අනාවරණය විය.

(i) මාර්ගය දෙපස පස් අන්තරාදායක නොවන ලෙස අතුරා සුසංගනය කිරීම වෙනුවෙන් රු.2,500 ක් ගෙවා තිබුණත් එකී කටයුත්ත සිදු කර තිබූ බවක් නිරීක්ෂණය නොවීය.

(ii) ඇස්තමේන්තුවේ අයිතම අංක 04 අනුව වර්ග මීටර් 255.42 ක් සඳහා අන්තර් සම්බන්ධිත කොන්ක්‍රීට් කුට්ටි ගල් 9502 ක් මාර්ගයට යෙදිය යුතු අතර ගෙවීම් වාර්තා අනුව ඒ සඳහා රු.323,068 ක් 2014 පෙබරවාරි 07 දින ගෙවීම් කර තිබුණි. එම මාර්ගය භෞතික පරීක්ෂාවේදී ගත් මිණුම් අනුව වර්ග මීටර් 228.58 ක් සිදු කර තිබූ අතර වර්ග මීටරයකට ගල් 40 ක් අල්ලා තිබීමෙන් අල්ලා තිබූ මුළු ගල් ප්‍රමාණය 9142 ක් විය. මේ අනුව ගල් 360 ක් වෙනුවෙන් රු.12,240 ක් වැඩියෙන් ගෙවා තිබුණි.

(ආ) විවිධ ව්‍යාපෘති

-------------------

ව්‍යාපෘති සඳහා 2013 අගෝස්තු මාසයේදි රු.2,778,829 ක් ගෙවා තිබුණි.

(i) ව්‍යාපෘති 2 කට අදාල මාර්ග ඉඩම් අනුබෙදුම් වලට අයත් විය.
(ii) ව්‍යාපෘති 4 කට අදාල මාර්ග සභාව සතු බවට ගැසට් කර නොතිබුණි.
(iii) පානිය ජල ව්‍යාපෘතිය සභාව සතු ඉඩමක සැලසුම් කර නොතිබුණි.
(iv) ව්‍යාපෘති ගිවිසුම් ලේකම්වරයා විසින් අත්සන් කර නොතිබුණි.

3.8 <u>වාහන පාලනය</u>

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 1647(ඉ) නියමය අනුව වාහන ලේඛනයක් සභාව විසින් පවත්වාගෙන ගොස් නොතිබුණි.

(ආ) වාහන සම්බන්ධයෙන් සමීක්ෂණයක් පවත්වා නොතිබුණි.

(ඈ) වාහන අළුත්වැඩියා කිරීමේදී හෝ අමතර කොටස් ඉවත් කිරීමේදී ඉවත් කරනු ලබන අමතර කොටස් හා උපකරණ මෙවලම් භාණ්ඩ විස්තර දක්වමින් ලේඛනයක් නඩත්තු කළ යුතු වුවද එසේ කර නොතිබුණි.

(ඇ) සභාවේ වාහන 20 කට අදාල මාසික සාරාංශ සකස් කර නොතිබූ අතර ධාවන සටහන්ද ඉදිරිපත් කර නොතිබුණි.

(ඉ) වාහන අනතුරු සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 103 හා 104 අනුව කටයුතු කර නොතිබුණි.

4. පද්ධති හා පාලන
-------------------
පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(i) ගිණුම්කරණය
(ii) ආදායම් පරිපාලනය
(iii) වාහන පාලනය
(iv) කොන්ත්‍රාත් පරිපාලනය
(v) තොග පාලනය
(vi) අයවැයකරණය